# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2364/31 - 2023 දෙසැම්බර් මස 29 වැනි සිකුරාදා - 2023.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාත් සභාවේ 2015 අංක 01 දරන බදු උකස්කරන්නන්ගේ ප්‍රඥප්තියේ 9(2) උපවගන්තිය සමග හා එම ප්‍රඥප්තියේ 53 වගන්තිය යටතේ සාදන නියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරන බදු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ 9(2) උපවගන්තිය හා එම ප්‍රඥප්තියේ 53 වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදනු ලබන පහත සඳහන් නියෝග මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි. තව ද මෙම නියෝග ක්‍රියාත්මක විය යුතු දිනය 2024 ජනවාරි මස 01 දින සිට බවට ද වැඩිදුරටත් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී,
පීඑච්ඩී(ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2023 ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**නියෝග**

01. මෙම නියෝග බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළ ගාස්තු තීරණය කිරීම හා උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් වෙනුවෙන් තැබිය යුතු ඇප තැන්පත් නිශ්චය කිරීම සඳහා ද එම කරුණට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1937/20 හා 2015 ඔක්තෝබර් 22 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩුඋකස්ගන්නන්ගේ රීති පරිච්ඡින්න කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබයි.

02. මෙම නියෝග 2023 අංක 01 දරන බඩුඋකස්ගන්නන්ගේ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ නියෝග යනුවෙන් හැඳින්වේ.

03. බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩුඋකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ 07 (03) වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා අය කළ යුතු ගාස්තු හා තැන්පත් මුදල පහත ආකාරයට විය යුතුය.

| | *කාර්යය* | *වටිනාකම* |
|---|---|---|
| අ. | උකස්ගන්නන්ගේ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම | රු. 50,000.00 |
| ආ. | උකස්ගන්නන්ගේ ව්‍යාපාරය සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තුව | රු. 25,000.00 |
| ඇ. | උකස්ගන්නන්ගේ ව්‍යාපාරය කර ගෙන යාම සඳහා තැබිය යුතු ඇප තැන්පතු මුදල | රු. 500,000.00 |

04. ඉහත 2 වගන්තිය යටතේ තැන්පත් කළ යුතු මුදල මහජන බැංකුව, ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රාජ්‍ය බැංකුවල පමණක් තැන්පත් කළ යුතුය.

05. මෙම නියෝග ක්‍රියාත්මක වන දිනෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1937/20 හා 2015 ඔක්තෝබර් 22 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට ඇතුළත්* බස්නාහිර පළාතේ 2015 අංක 01 දරන බඩු උකස්ගන්නන්ගේ රීති, ඒ යටතේ ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

06. මෙම නියෝගයන්හි සිංහල, ඉංග්‍රීසි හා දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG 12 - 0390

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.